CM
EV
**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No 160G, Poorwarama Road, Kirulapone. **Tel:** +094-11 2826388/+094-11 2826384
**Tel:** +094-11 2826381 /+094-11 2826387 /+094-11 2826380
**Fax**: +094-11 2826146 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

බැසිල් රාජපක්ෂ මහතා,
නිසි බලධාරී,
අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යෑම හා සම්බන්ධීකරණය,
පසුවිපරම සඳහා ප්‍රතිෂ්ඨාපිත ජනාධිපති කාර්ය සාධක බලකාය,
අග්‍රාමාත්‍ය කාර්යාලය,
මල් පාර,
කොළඹ 07.

2020 අප්‍රේල් 06

කොවිඩ් -19 ව්‍යසනය පිටුදැකීමේ කාර්යය හා සමගාමී සහන සැලසීමේ ක්‍රියාවලිය

හිතවත් බැසිල් රාජපක්ෂ මහත්මාණෙනි,

ඉතා අනපේක්ෂිත එහෙත් බිහිසුණු ජාතික ආපදාමය පසුබිමක සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේ අනලස් හා අධිෂ්ඨානශීලි කැපවීමක් ප්‍රදර්ශනය් විය යුතු තීරණාත්මක මොහොතක් වෙත අප සියලුදෙනා ප්‍රවිෂ්ඨ වී ඇතැයි යන්න අපගේ විශ්වාසයයි. එවන් භාරදූර ජාතිකමය කාර්යභාරයක් නිවැරදිව හා කාර්යක්ෂමව සංවිධානය කිරීම රජයේ ප්‍රමුඛතම වගකීම විය යුතුය. එහිලා වත්මන් රජය මෙතෙක් අනුදත් විවිධ මුලපිරීම් මෙම ව්‍යසනකාරීත්වය පිටුදැකීම සඳහා බොහෝ සෙයින් මහෝපකාරී වූ බව අපගේ අදහසයි.

තවද අභිනවයෙන් පිටුවන ලද කාර්යසාධක බලකායේ ක්‍රියාකාරකම් ද මෙම ජාතික ආපදාවෙන් පීඩාවට පත්ව සිටින දහස් සංඛ්‍යාත ජනකායකට සහනශීලීත්වයක් ගෙන එනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

ඊට සමගාමීව අවශ්‍යයෙන්ම අවධානයට ලක් කලයුතු තීරණාත්මක සාධකයක් පිළිබඳව ඔබ සහ ඔබ කාර්ය සාධක බලකායේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු. වසර 2020 මාර්තු මස 31 වැනි දින ප්‍රකාශිත, චක්‍රලේඛ අංක PTF 03/2020 යටතේ නිකුත් කොට ඇති නවතම චක්‍රලේඛයයි. එහි සඳහන්ව ඇත්තේ 'උද්ගතව ඇති ව්‍යසනකාරී තත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොන්දු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු. 5,000 දීමනාවක් ගෙවීම'' යනුවෙනි.

පිහිටක් අවැසි සහෝදර ජනප්‍රජාවකට නිවැරදි ක්‍රමවේදයක් යටතේ සහනාධාර බෙදීම නිසි කළමනාකරණයට ලක් කිරීමේ අරමුණින් යෝජිත මෙම යාන්ත්‍රණය පිළිබඳ පළමුව අපගේ ප්‍රසාදය පිරිනැමීමට කැමැත්තෙමු. එහෙත් එහිලා පැනනැගී ඇති බාහිර එහෙත් කඩිනම් අවධානයට ලක්වියයුතු කරුණු කිහිපයක්ද ඇත්තේය. එකී කරුණු පිළිබඳව ඔබ කාර්ය සාධක බලකාය වෙත දැන්වීම මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස අප සතු වගකීමක් යැයි හඟිමු.

ගම් මට්ටමින් සහන සැලසීමේ කාර්යය ක්‍රියාවට නැගීම සඳහා යෝජිත කමිටුවට ඇතුළත් සාමාජිකයන් සයදෙනා අතර පළමුව සඳහන්ව ඇත්තේ ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය හොබවන මහජන නියෝජිතයාගේ නියෝජනයයි. එනම් චක්‍රලේඛයට අනුව  පළාත් පාලන කොට්ඨාශ නියෝජිතයාය.

මෙකී නියෝජනය හඳුනාගැනීමේදී හා එක්ව ක්‍රියාකිරීමට යෑමේදී ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා මෙන්ම ග්‍රාම නිලධරයා බලවත් අපහසුවට පත් විය හැකි අතර ඒ පිළිබඳ පැමිණිලි දැනටමත් අප සංවිධානය වෙත විවිධ පාර්ශ්ව මගින් ලැබී ඇත. ඊට හේතුව වී ඇත්තේ පහත සඳහන් කරුණුය.

01. අවසන් වරට මෙරටේ පැවති පළාත් පාලන ඡන්ද විමසීම පැවැත්වූයේ මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් යටතේය. ඒ 60% ක් හා 40% ක් ලෙස පිළිවෙලින් කොට්ඨාශ සහ සමානුපාතිකමය ක්‍රමවේදයක් යටතේය. එවන් පසුබිමක කොට්ඨාශ නියෝජිතයන් බොහෝ විට තේරී පත්ව ඇත්තේ ඉතා අඩු ඡන්ද ප්‍රමාණවලින් වන අතර එකී තේරීපත්වීම් ඡන්ද දහයකටත් වඩා අඩු ප්‍රමාණයකින් සිදු වූ අවස්ථාද සුලභය. තවද සමානුපාතිකමය නියෝජනයට යටත්ව 40% ක ප්‍රමාණයක් ලෙස නම් කරන ලද නියෝජිතයන් හට නිශ්චිත කොට්ඨාශයක් ද ඇත්තේ නැත. එවන් නියෝජිතයන් මෙවැනි ක්‍රමවේදයකදී ස්ථානගත කරනු ලබන්නේ කවරාකාරයෙන්ද යන්න ගැටලුසහගතය.

02.  මීන් බලවත් අගතියට පත්වියහැකි අනෙක් පාර්ශවය වන්නේ පළාත් පාලන ආයතන නියෝජනය කරනු ලබන කාන්තා සභිකවරියන්ය.  1919 ක් වන එකී සභිකවරියන් අතරින් යම් නිශ්චිත කොට්ඨාශයක් තුළ තම දේශපාලන ක්‍රියාකාරකම් සිදුකරනු ලබන්නේ කාන්තා සභිකවරියන් 537 දෙනෙක් පමණි. ඊට හේතුව නම් තරග කොට අදාළ කොට්ඨාශ ජයගෙන ඇත්තේ එවන් ප්‍රමාණයක අඩු කාන්තාවන් සංඛ්‍යාවක් වීමයි. ඒ අනුව අනෙක් කාන්තා නියෝජිතයන් 1382 ක සමස්ත පිරිස ම අවිනිශ්චිත මෙන්ම දේශපාලනිකව යම් අක්‍රියවීමකට පත්වීමේ  අනතුරක් පැවතීම පහසුවෙන් බැහැර කල හැකි කරුණක් නොවේ.

03. පළාත් පාලන ආයතන කිහිපයකම අදාළ සභාපතිවරුන් පවා තෝරාගන්නා ලද්දේ කාසියේ වාසිය උරගා බැලීමෙන් අනතුරුවය. තවද දිවයිනේ විවිධ පළාත් පාලන ආයතන වෙත තෝරා පත් කරගන්නා ලද සභිකයන් දස දෙනෙක් පමණද තෝරා ගන්නා ලද්දේ එපරිදිමය.  එලෙස හුදු තාක්ෂණික කරුණක් තුළ ධූරය අහිමිව ඇති මහජන නියෝජිතයන් මෙවැනි යාන්ත්‍රණයකින් බැහැර කිරීම එතරම් උචිත කරුණක් නොවන බව අපගේ අදහසයි.

මෙවැනි ජාතික ආපදාමය පසුබිමක නිසැකවම සිදුකල යුතු සහන සැලසීමේ ක්‍රියාදාමයක් බිඳදැමීම හෝ අසීරුවට පත්කිරීම අපගේ අභිලාශය නොවේ. එනමුත් එවන් ක්‍රියාදාමයක් ඉහත පැහැදිලි කරන ලද ආකාරයේ පසුබිමක ක්‍රියාවට නැගීම ද ඔබ සහ ඔබ කාර්ය සාධක බලකාය සිදුකරන්න තැත් කරන සත්කාර්යය අභියෝගයට ලක්විමකි.

එවන් පරිසරයක සිදුකල යුතු වඩාත් කාලීන ක්‍රමවේදය ලෙස අප සලකනු ලබන්නේ යම් කොට්ඨාශයකට තරග කොට අඩු ඡන්ද පරතරයකින් සභික ධූරය අහිමිවූ අපේක්ෂකයා වෙත හෝ මෙකී කමිටුවේ නියෝජනයක් සඳහා ආරාධනා කල යුතු බවයි. ඊට අමතර වශයෙන් කොට්ඨාශයක් නිශ්චිතව නියෝජනය නොකරන එහෙත් පළාත් පාලන ආයතනයේ සභිකධූරය දරන කාන්තා නියෝජිතයන් ප්‍රමුඛ අනෙකුත්

පිරිස්ද ඔවුන්ගේ අභිමතය හා ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය යටතේ කමිටු තුළට ඇතුළත් කිරීම වඩාත් කාලෝචිතය.

තවද ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරීන් ප්‍රමුඛ අනෙකුත් ගම් මට්ටමේ රජයේ  සේවක සේවිකාවන් ඉතා විශිෂ්ඨ කාර්යභාරයක් සිදුකරමින් සිටින සමයක, මෙවන් කමිටු හා සබැඳි කරුණු හමුවේ ඔවුන් මන්දෝත්සාහිත්වයට පත් කිරීම කිසිසේත් සිදු නොවිය යුත්තකි.

එමෙන්ම මෙකී පළාත් පාලන මැතිවරණ ක්‍රමය මුල් වරට කෙටුම්පත් කරන ලද්දේ ඔබගේ උපදෙස් හා මුලපිරීමෙන් බව අපගේ අවබෝධයයි. එවන් පසුබිමක කවර හෝ අවස්ථාවකදී එක් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන නියෝජිතයන් සුළුතරයකට පමණක් රජයේ යාන්ත්‍රණයක් නියෝජනයට අවස්ථාව සැලසීම පළාත් පාලනය වැනි ක්ෂේත්‍රයක ඉතා අවදානම් මෙන්ම අප නිරතුරු ප්‍රවර්ධනයට උත්සහ දරන සම්මුතිවාදී දේශපාලන දැක්ම අවතක්සේරුවට ලක් කරන්නක් ය යන්න තවත් පහසුවෙන් බැහැර කල නොහැකි තර්කයකි.

අප ඉහත ද දක්වා ඇති පරිදි,  කාර්ය සාධක බලකායේ කාර්යභාරය නිසැකවම අත්‍යාවශ්‍ය පසුබිමක් මෙරටෙහි මේ වන විට නිර්මාණය වී ඇති අතර  එහි විධිමත් භාවිතාවක් අපේක්ෂාවෙන් පමණක් මෙම ඉල්ලීම සිදුකර ඇති බව අවධාරණය කිරීමට කැමැත්තෙමු.

තවද මෙකී කරුණ පිලිබඳ ඔබතුමන්ගේ කඩිනම් අවධානයද යොමුවනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

ස්තුතියි,

මංජුල ගජනායක,
ජාතික සම්බන්ධීකාරක

---

පිටපත්: මහින්ද දේශප්‍රිය මහතා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ පාර, රාජගිරිය

අග්‍රාමාත්‍ය ලේකම්, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී -අත්‍යාවශ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යෑම හා සම්බන්ධීකරණය, පසුවිපරම සඳහා ප්‍රතිෂ්ඨාපිත ජනාධිපති කාර්ය සාධක බලකාය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මල් පාර, කොළඹ 07.

සමන් ශ්‍රී රත්නායක මහතා, කොමිෂනර් ජෙනරාල්, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ පාර, රාජගිරිය